## 414 පාතිමාවේ මෑණී

පාතිමාවේ මෑණී //
අප කුමාරී
දේව දාරී
කන්ති නාරී
මව් මරී

හිරු පබා පා ඔබ නමා
තේජ මාතා පාතිමා
රෝස වස්වා ආස දිස්වා
හිරු පබා පා ඔබ නමා

යදින සේ කී පා සමා
ලෝක මාතා පාතිමා
රෝස වස්වා ආස දිස්වා
දෙන්නැ ඉල්ලා පා සමා

රෝස මාලාවේ අමා
යදිමු පා මා පාතිමා
රෝස වස්වා ආස දිස්වා
රෝස මල් මාලා දමා

ඔබ හදේ මාතා අමා
අප කෙරේ පා පාතිමා
රෝස වස්වා
ආස දිස්වා
අප රකින්වා පාතිමා